


**මෙම සමාගමේ  කටුනායක බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොල / කොළඹ ජාත්‍යන්තර ගුවන් තොටුපොල රත්මලාන  හා මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපොල පවතින පහත සඳහන් තනතුරෙහි පුරප්පාඩු  පිරවීම සඳහා සුදුසුකම් ලත් පුද්ගලයින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.**

# කාර්මික ශිල්පී (විදුලි) 11 වන ශ්‍රේණිය තනතුර

**රැකියාවේ ස්වභාවය** : අධීක්ෂණ නිලධාරින්ගේ උපදෙස් පරිදි කාර්යක්ෂමව හා අඛණ්ඩව සමස්ථ විදුලි බල සැපයුම නිසි පරිදි ක්‍රියාත්මක කිරීම, බෙදා හැරීම, නඩත්තු කිරීම හා සියළුම විදුලි උපකරණ, යන්ත්‍ර හා ගොඩනැගිලි වල විදුලි පද්ධති සැකසීම හා නඩත්තු කිරීම.

**රැකියාවේ  වගකීම්** :

(I) මැනීමේ සහ පරීක්ෂා කිරීමේ උපකරණ විධිමත්ව භාවිතා කිරීම හා  ඒවායේ ආරක්ෂාව තහවුරු කිරීම.

(II) විදුලි උපකරණ, මෙවලම් භාවිතය හා ඒවායේ ක්‍රියාකාරිත්වය හා  නඩත්තුව පිළිබඳව මනා අවබෝධයක් ලබා තිබීම.

(III) විදුලි කාර්මිකයින්ගේ ලොග් සටහන් පොත් දිනපතා සම්පූර්ණ කිරීම.

(IV) ගොඩනැගිලි වල විදුලි පරිපථ, යන්ත්‍රෝපකරණ සහ උපකරණ කාර්යක්ෂමව පවත්වා ගෙන යාම සඳහා අවශ්‍ය  නඩත්තු කටයුතු කිරීම.

(V) විදුලි කාර්මික වැඩ වල නිරතවීමේදී  පුද්ගලයින්ට හා උපකරණ වලට සිදුවන අනතුරු වලක්වා ගැනීම සඳහා අනිවාර්යයෙන්ම ආරක්ෂිත විධිවිධාන අනුගමනය කිරීම.

(VI) විදුලි අර්බුද අවස්ථා වලදී ගුවන් තොටුපොලේ ක්‍රියාකාරීත්වය පවත්වා ගෙන යාම සඳහා  සක්‍රිය ලෙස දායක වීම.

(VII) විටින් විට සිදුකළ යුතු පරීක්ෂා කිරීම් සැලැස්මට අනුව සිදු කිරීම.

**සුදුසුකම් :**

(අ) ජාතික ආධුනිකත්ව මණ්ඩලයෙන්/ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරියෙන් නිකුත් කරනු ලැබූ විදුලි ක්ෂේත්‍රයේ දැවුරුද්දකට (02)නොඅඩු පූර්ණ කාලින පාඨමාලා සහතිකයක් හෝ දැවුරුද්දකට (02) නොඅඩු පූර්ණ කාලීන පාඨමාලාවක් හැදෑරීමෙන් අනතුරුව කාර්මික විද්‍යාලයක් මගින් නිකුත් කරනු ලැබූ වෘත්තිය ආධුනිකත්ව සහතිකයක් ලබා තිබීම.

**හෝ**

(ආ) ජාතික වෘත්තිය සුදුසුකම් 4 වන මට්ටම (NVQ Level 4) වෘත්තිය සහතිකයක් විදුලි ක්ෂේත්‍රයෙන් ලබා තිබිම.

**සහ**

(ඇ) ආධුනිකත්ව කාලසීමාවද/පාඨමාලා කාල සිමාවද ඇතුලත්ව සිව් (04) වසරක පළපුරුද්දක් අදාළ ක්ෂේත්‍රයෙන් ලබා තිබිම.

**වයස :**

අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය වන විට අවුරුදු 35ට නොවැඩි විය යුතුය.

**වැටුප :**

තෝරාගනු ලබන්නන් හට සියළු දීමනා සහිත ආකර්ෂණිය වැටුපක් හා ප්‍රතිලාභ රැසක් හිමිවේ.

**බඳවා ගැනිමේ ක්‍රමය:** ප්‍රායෝගික පරික්ෂණයක් සහ සම්මුඛ පරික්ෂණයක් මගින්

**පොදු කරුණු :-**

ඉහත තනතුර සඳහා තෝරාගනු ලබන අයදුම්කරුවන් දිවයිනේ පිහිටි ඕනැම ගුවන් තොටුපොලක අවශ්‍ය වූ විට සේවය කල යුතුවේ.

ඉහත සුදුසුකම් හා සේවා පළපුරුද්ද ලබා තිබේ නම් මෙම වෙබ් අඩවියේ ඇති ආදර්ශ අයදුම්පත්‍රයට අනුව සකස් කල අයදුම්පතක් පහත සඳහන් ලිපිනයට 2023 **ඔක්තෝබර් මස 16 වන දිනට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපැලෙන් හෝ කුරියර් සේවා මගින් පමණක්** ඉදිරිපත් කළ යුතුවේ. අයදුම්පත් බහාලන කවරයේ ඉහළ වම් කෙළවරේ **කාර්මික ශිල්පී (විදුලි) II වන ශ්‍රේණිය** යන තනතුර සඳහන් කළ යුතුවේ.

**2021 දෙසැම්බර් මස 02 වන දින කාර්මික ශිල්පී (විදුලි ) තනතුර සඳහා පළකල දැන්වීම අවලංගු කරන අතර ඒ සඳහා අයදුම්කල අයදුම්කරුවන්ද මෙම දැන්වීමේ සඳහන් සුදුසුකම් අනුව නැවත අයදුම්කල යුතුවේ.**

තෝරා ගැනිමේ ක්‍රියාවලියේ සෑම අදියරකදීම සුදුසුකම්ලත් අයදුම්කරුවන්ට පමණක් දැනුම් දෙනු ලැබේ.

පාඨමාලා සහතික හා සේවා සහතික සහ අදාළ සහතිකවල ජායා පිටපත් සමග ඉදිරිපත් නොකරන අයදුම්පත් සහ අපගේ වෙබ් අඩවියේ ඇති ආදර්ශ අයදුම්පත්‍රයට අනුව ඉදිරිපත් නොකරන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**සභාපති**
**එයාර්පෝර්ට් ඇන්ඩ් ඒවියේෂන් සර්විසස් (ශ්‍රී ලංකා) (ප්‍රයිවට්) ලිමිටඩ්**
**බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොල**
**කටුනායක**

Date : 03/10/2023